අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/03/53/02/15/පොදු

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.03. 22

අභ්‍යන්තර චක්‍රලේඛ අංක : 11/2024

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

උප කුලපති, සාගර විශ්ව විද්‍යාලය

**උ.පෙ. වෘත්තීය විෂය ධාරාවේ සිසුන්ගේ වෘත්තීය පුහුණු කටයුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස සිදු කිරීම.**

NVQ 04 මට්ටමේ වෘත්තීය පුහුණුව ලැබීමට උසස් පෙළ වෘත්තීය විෂය ධාරාවේ 13 ශ්‍රේණියේ දී වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවලට යොමු වන පාසල් සිසුන්ට පුහුණුව ලබා දී, අප්‍රමාද ව NVQ 04 සහතිකය ලබා දීම, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු ආයතනවල ප්‍රමුඛ වගකීමක් බව අවධාරණය කරමි.

2. 2024 වසරේ සිට මෙම විෂය ධාරාව තවදුරටත් ප්‍රවර්ධනය කරමින්, මෙහි ළමුන්ට ඇති අවස්ථා වඩාත් පුළුල් කළ යුතු ය. ඒ සඳහා පහත උපදෙස් අනුව කටයුතු කළ යුතු ය.

2.1. **වෘත්තීය පුහුණු ආයතන සඳහාවන උපදෙස්**

i. NVQ 04 පාඨමාලාවලට වාර්ෂික ව සිසුන් ඇතුළත් කරන විට, මෙම විෂය ධාරාවේ සිසුන්ට ප්‍රමුඛත්වය දිය යුතු ය.

ii. සිසුන්ගේ පුහුණුව නියමාකාරයෙන්, පුහුණු කාල රාමුවට අනුගත ව පැවැත්විය යුතු ය. එසේ ම, අප්‍රමාද ව මධ්‍යස්ථානගත පුහුණුව/ කෙටි කාලීන ආයතනගත පුහුණුව නිමා කළ යුතු ය.

iii. පුහුණුව නිමා කරන සිසුන් අප්‍රමාද ව රැකියා ස්ථානයේ පුහුණුවට යොමු කිරීමටත්, නියාමනයෙන් එම පුහුණුව නිසි ආකාරයෙන් සිදුවන බවට වග බලා ගැනීමටත්, පියවර ගත යුතු ය.

iv. පුහුණුව නිමා කරන සිසුන්ගේ ඇගයීම් සිදු කිරීම ද, සහතික පත්‍ර නිකුත් කිරීම ද, අප්‍රමාදව සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතු ය.

v. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල කාර්යය සාධනය නියාමනය කිරීමේ දී මෙම විෂය ධාරාව හරහා යොමු කළ සිසුන්ගෙන් මධ්‍යස්ථානයට බඳවා ගත් ප්‍රතිශතය සහ NVQ 04 මට්ටමට ළඟා වීමේ ප්‍රතිශතය සැලකිල්ලට ගත යුතු ය.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832 / +94112784825 / minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811 / +94112785162 / secretary.education@moe.gov.lk

CamScanner

2.2. **තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහාවන උපදෙස්**

i. පුහුණුව නිමා කරන විෂය ධාරාවේ සිසුන්ගේ ඇගයීම් සිදු කිරීම ද සහතික පත්‍ර නිකුත් කිරීම ද අප්‍රමාද ව සිදු කළ යුතු ය.

ii. සිසු කණ්ඩයාම් ලියාපදිංචි කිරීමේ සිට සහතික පත්‍ර නිකුත් කිරීම තෙක් මෙම සිසුන්ගේ පුහුණුව නියමාකාරයෙන්, පුහුණු කාල රාමුවට අනුගත ව පැවැත්වීම සඳහා ආයතනවලට පහසුකම් සැලසීම ද, මහ පෙන්වීම ද, සිදු කළ යුතු ය.

iii. TVEC දත්ත පාදකයේ මෙම සිසුන්ගේ දත්ත වෙන් ව පවත්වා ගත යුතු අතර, වගකිව යුතු පාර්ශවවලට නිකුත් කළ යුතු ය.

iv. මෙම තොරතුරු වාර්තා පරීක්ෂා කිරීම සඳහාවන TVEC දත්ත පාදක ප්‍රවේශය, අදාළ වගකිව යුතු නිලධාරීන්ට ලබා දිය යුතු ය.

වසන්තා පෙරේරා
ලේකම්



CamScanner